14 වන පිටෙන්




කටයුතු නොකරනු ඇත. එසේ ම අම්පාර, ත්‍රිකුණාමලය වැනි නැගෙනහිර පළාත තුළ ජනතා විමුක්ති පෙරමුණේ ඡන්ද පදනම ද මේ වන විට ශක්තිමත් වී තිබේ.

ඉන් පසුව ඉතිරි වන්නේ උතුරේ ඡන්දය. එම ඡන්දවලින් 90% කටත් වැඩි ප්‍රමාණයක් රනිල් වික්‍රමසිංහට ලැබෙන බව නිසැකය. ඒ ලැබෙන්නේ ජනතාවගේ කැමැත්ත නිසා ම නොව, ප්‍රභාගේ තුවක්කුවේ බලය නිසාය. කෙසේ වෙතත් ඒ ඡන්ද ලබා ගැනීමට නම් මහින්දට අංශක අනූවක් නොව 180ක් ම ආපසු හැරීමට සිදුවනු ඇත. එවිට ජවිපෙ සහායත්, හෙළ උරුමය වැනි පක්ෂවල සහායත් අහිමි වීම නිසැකය. එසේ වුව ද එල්ටීටීඊ සංවිධානය හා දෙමළ රාජ්‍ය පක්ෂය ඔහුව විශ්වාස කරනු ඇතැයි සිතීම අසීරුය. මේ නිසා මහින්ද රාජපක්ෂට තමන්ගේ ජයග්‍රහණය තක්සේරු කිරීමට සිදුවන්නේ උතුරේ ඡන්ද මුළුමනින්ම අමතක කොට ය. එහෙත් දකුණේ දිනා ගන්නා ඡන්ද සමඟ සැසඳූ විට එය එතරම් පාඩුවක් නොවන බව මහින්දගේ ඡන්ද සටනේ නියමුවන්ගේ අදහසය.

කෙසේ වෙතත් අපගේ මේ ගණන් බැලීම නිවැරැදි වනු ඇත්තේ ජනාධිපතිවරණ සටන මහින්ද හා රනිල් අතරට සීමා වන්නේ නම් පමණකි. ජනාධිපතිවරණය 2005ට ලබා ගැනීමට අධිකරණයට ගිය ජාතික හෙළ උරුමය පවසන්නේ තමන්ගේ කොන්දේසි පිළිගන්නා අපේක්ෂකයාට තම සහාය දෙන බවය. නැතහොත් තමන්ද අපේක්ෂකයකු ඉදිරිපත් කරන බවට හෙළ උරුමය ද සියුම් 'තර්ජනයක්' කර තිබේ. හෙළ උරුමයට වඩා පහසුවෙන් ලංවිය හැක්කේ මහින්දටය. එහෙත් කතානායක තෝරා ගැනීම වැනි තීරණාත්මක අවස්ථාවක දී එක්සත් ජාතික පක්ෂයේ කොන්ත්‍රාත් ඉටුකළ හෙළ උරුමයේ හැසිරීම දූන් ම තීරණය කිරීම අසීරුය.

කෙසේ වෙතත් හෙළ උරුමය අපේක්ෂකයකු ඉදිරිපත් කිරීම ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනාට ම අවාසි වන්නේ ජනතා විමුක්ති පෙරමුණ ද අපේක්ෂකයකු ඉදිරිපත් කළහොත් පමණ ය. ඒ අවාසිය වැඩි වශයෙන් අත් විඳීමට සිදුවනු ඇත්තේ මහින්දට ය. හෙළ උරුමය හා ජවිපෙට වැඩි වශයෙන් ලැබෙන්නේ සිංහල බෞද්ධ ඡන්ද බැවිනි. එහි අනිවාර්ය ප්‍රතිඵලය වනු ඇත්තේ මහින්ද පරාජය වීමය.

රනිල් වික්‍රමසිංහ හා ඔහුගේ පක්ෂය පමණක් නොව, ආණ්ඩුවේ ද ඇතැමුන් මහින්දගේ පරාජය අපේක්ෂාකරන බවක් ඔහුව අපේක්ෂකත්වයට පත් කළ දිනයේ සිට ම දක්නට තිබිණ. මේ බව පෙන්නුම් කරන්නේ ජාතික රූපවාහිනිය, ශ්‍රවන් විදුලි සංස්ථාව, ලේක්හවුස් ආයතනය වැනි රාජ්‍ය මාධ්‍ය මඟිනි. අගමැතිවරයා ජවිපෙ සහාය ලබා ගැනීමට දැඩි පරිශ්‍රමයක යෙදී සිටිය දී රාජ්‍ය මාධ්‍ය ජවිපෙට පහරදීමේ ප්‍රතිපත්තියකට අවතීර්ණ වී සිටී. මේ ආයතන සියල්ලේ ම ප්‍රධාන තනතුරු උසුලන්නේ ජනාධිපතිනියගේ සමීපතමයන් ය. එසේ ම දූනට ජනමාධ්‍ය අමාත්‍ය ධුරය හොබවන්නේ ද ජනාධිපතිනියයි. මෙය ජනාධිපතිවරණය ජය ගැනීමට මහින්දට ඇති තවත් අභියෝගයකි. මීට පෙර ඔහු කුමන තනතුරු දැරුව ද පෞද්ගලික මාධ්‍ය තුළින් ඔහුට මනා සහායක් ලැබිණ. එහෙත් මේ තීරණාත්මක මොහොතේ සියලු පෞද්ගලික මාධ්‍ය පේවී සිටින්නේ රනිල් වික්‍රමසිංහගේ ජයග්‍රහණය වෙනුවෙනි.

සටන් විරාම ගිවිසුම තුළ වඩාත් ශක්තිමත් වූ සිය අවසාන ඉලක්කයට ළඟා වීම සඳහා පියවර ගණනාවක් ඉදිරියට ගිය එල්ටීටීඊ සංවිධානය පසුගිය අගෝස්තු 12 දා සිය තවත් ප්‍රධාන ඉලක්කයක් සපුරා ගත්තේය. ඒ නිදහසින් පසු මෙරට බිහිවූ සාර්ථකම විදේශ අමාත්‍යවරයා වූ ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය කිරීමය. කදිරගාමර් මහතා ගැන කතා කරද්දී බොහෝ දෙනා කියන්නේ එල්ටීටීඊ සංවිධානය ඔහුව සතුරෙකු ලෙස සැලකූ බවය. එල්ටීටීඊ සංවිධානය පමණක් නොව එක්සත් ජාතික පක්ෂය ද ඔහුට සැලකුවේ සතුරෙකු ලෙසිනි. එල්ටීටීඊ සංවිධානයට විරුද්ධ වීමම එක්සත් ජාතික පක්ෂයට විරුද්ධ වීමකි. අනෙක් අතට එක්සත් ජාතික පක්ෂය පරාජය කිරීම සඳහා ශ්‍රීලනිප-ජවිපෙ සන්ධානය ගොඩ නැඟීම පිටු-පස සිටි යෝධ ශක්තිය වූයේ ඔහුය. බිඳී ගිය මේ සන්ධානය යළි ගොඩනැඟීම සඳහා ඝාතනයට ලක්වන තුරුම ඔහු කටයුතු කරමින් සිටියේ ය. එසේ ම, අභ්‍යන්තර ආරවුලකින් තොරව මහින්ද රාජපක්ෂ ජනාධිපති අපේක්ෂකයා ලෙසත්, අනුර බණ්ඩාරනායක අගමැති අපේක්ෂකයා ලෙසත් තෝරා ගැනීම තුළ ද කදිරගාමර් මහතා විශාල වැඩ කොටස-ක් සිදුකළ බව දන්නේ ටික දෙනකු පමණකි. එහි දී ඔහුගේ මතය වූයේ රනිල් වික්‍රමසිංහ පැරදවීමට සුදුසුම අපේක්ෂකයා මහින්ද නිසා කුමන ප්‍රශ්න තිබුණ ද ඔහුව ජනාධිපති අපේක්ෂකයා ලෙස නම් කළ යුතු බව ය. ඔහුගේ දේශපාලන පරිණත භාවය තේරුම් ගැනීමට මෙම අවස්ථාව වුව ප්‍රමාණවත් ය.

කදිරගාමර් මහතාගේ ඝාතනයට වටිනාකම-ක් දිය හැක්කේ ඔහු පෙනී සිටි අරමුණ ජයගැනීමෙන් වුව ද ආණ්ඩුව කළේ ඔහුගේ ඝාතනයේ උණුසුම යන්නටත් පෙර සාකච්ඡා සඳහා එල්ටීටීඊ සංවිධානයට ආරාධනා කිරීමය. කදිරගාමර් ඝාතනය සිදුවූ අවස්ථාවේ ම එය එල්ටීටීඊ ක්‍රියාවක් බව කියන්නට ද පැකිලුණු ආණ්ඩුව ඔහු පිළිබඳ ගුණ කථන සිදුකළේ ද එල්ටීටීඊ විරෝධී ස්ථාවරය රට තුළ ස්ථාපිත වීම සීරුවෙන් වලක්වමිනි. කදිරගාමර් ඝාතනය කළ අවස්ථාවේ ජාතික රෝහලට ගොස් හඬා වැටුණු ජනාධිපතිනිය ඇගේ කඳුළු පිස දමා කළ පළමු කාර්යය වූයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව සමයේ සිට ම ඇණ හිට තිබූ සාම සාකච්ඡා යළි ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස නෝර්වේ අගමැතිවරයාට දැනුම් දීම ය. මේ වන විට, ලන්ඩනයේ ද බෝම්බ පුපුරා ත්‍රස්තවාදයට එරෙහි ජනමතය කුළු ගැන්වී තිබූ බවත්, අමතක නොකළ යුතුය. එනිසා ජනාධිපතිනියගේ ඇරයුම එල්ටීටීඊ සංවිධානයට ඉබ්බා දියට දැමීමක් විය.

ජනාධිපතිනිය මේ හදිසියේ එල්ටීටීඊ සංවිධානය සමඟ සාකච්ඡා කිරීමට සූදානම් වන්නේ කුමන අරමුණකින් ද යන්න පැහැදිලි නැත. පසුගිය මාස කිහිපය තුළ ඇගේ බො-හෝ තීරණ පිළිබඳ තත්වය එසේය. එහෙත් එල්ටීටීඊ සංවිධානයේ අරමුණ සටන් විරාම ගිවිසුම සංශෝධනය කර ගැනීමය. ඒ හරහා තමන්ගේ ප්‍රධානම ප්‍රතිවාදියා වන කරුණා නිරායුධ කර ගැනීමය. සටන් විරාම ගිවිසුම අත්සන් කරන අවස්ථාවේ කරුණා ප්‍රභාගේ දකුණු අතය. ගිවිසුම මඟින් ඊපීඩීපී වැනි සංවිධාන නිරායුධ කොට එල්ටීටීඊ අශ්වයාට 'අං' ලබා දුන්නේ ය. දූන් කරුණා පිළ නමින් තවත් සංවිධානයක් තිබේ. කරුණාව ආයුධ මඟින් මර්ධනය කිරීමට තරම් ශක්තියක් ප්‍රභාට නැත. තිබුණත් එය තමන්ට ද හානි දෙන්නක් විය හැක. පහසුම මාර්ගය වන්නේ සාම මාවතේ ගොස් කරුණාගේ 'දත්' ගැලවීමය.

කෙසේ වෙතත් ජනාධිපතිනිය මෙම සාකච්ඡා ආරම්භ කරන්නට අදහස් කළේ ජනාධිපතිවරණය 2006 පැවැත්වීමේ අරමුණෙන් විය යුතුය. එහෙත් දූන් ජනාධිපතිවරණය පැවැත්වෙන්නේ 2005 බැවින් මෙම න්‍යාය පත්‍රය වෙනස් විය හැක. එය පමණක් නොව රටේ සියලු දේ ජනාධිපතිවරණ දිනය ප්‍රකාශයට පත් කිරීමත් සමඟ වෙනස් වනු ඇත. ඒ වෙනස් වීම් සිදුවන්නේ මේ වසරේ නොවැම්බර් මාසයෙන් පසු විශාල වෙනසක් අපේක්ෂාවෙනි. ඒ වෙනස කළ හැක්කේ මහින්දට ද? රනිල්ට ද? රටේත් ජනතාවගේත් යහපත සැලසෙන පරිදි ඒ වෙනස සිදුකළ හැකි බවට වඩා හොඳින් විශ්වාස ගැන්විය හැකි පුද්ගලයාට ජනතා විශ්වාසය හිමිවනු ඇත.

■

8 වන පිටෙන්




අධ්‍යනයක් සිදු කිරීමට අපේක්ෂා කරයි නම් දුරදක්නයක් සහ තොරතුරු සටහන් කර ගැනීමේ සටහන් පොතක් වැදගත් වේ. කඳවුරු බිමේ සිට කරන සංචාරය පා ගමනින් කෙරෙන්නක් නම් මාර්ගය නිවැරදිව දැන ගැනීම සඳහා මාලිමාවක් ළඟ තබා ගැනීම වඩාත් යෝග්‍ය වේ.



කඳවුරු බිමක දින කිහිපයක් ගත කිරීමේ දී අවශ්‍ය වන මූලිකම සාධකයක් වන්නේ ජලයයි. සාමාන්‍යයෙන් ජාතික වනෝද්‍යානවල කඳවුරු බිම් සකසා ඇත්තේ ජලාශයක් හෝ ගඟක් ආශ්‍රිතව ය. යම් හෙයකින් එවැනි කඳවුරු බිමකින් බැහැරව ආගන්තුක ස්ථානයක කඳවුරු බිමක් සකසා ගන්නේ නම් ඒ අවට පහසුවෙන් ජලය ලබාගත හැකි දිය පහරක් ඇති බව අනිවාර්‍යයෙන් ම තහවුරු කරගත යුතු ය. කඳවුරු බිමක වැසිකිළි පහසුකම් නොමැති බැවින් ඒ සඳහා සෑම විට ම තෝරාගත යුත්තේ ජල පහරට හා කූඩාරමට පහළින් ඇති ප්‍රදේශයයි.

කූඩාරම් බිමක රැඳී රාත්‍රියක ගිනිමැලයක් යනු එහි අපූර්වත්වය වඩාත් තීව්‍ර කරන සාධකයකි. එසේ ම, වනසතුන් ඈත්කර තබා, ආරක්ෂාව සලසාගත හැකි උපක්‍රමයකි. ගිනිමැලයක් සකසා ගැනීමේ දී මතකයේ තබාගත යුතු ප්‍රධාන ම කාරණය වන්නේ ගිනිමැලය කූඩාරමෙන් ඈත්ව සකස් කර ගැනීමයි. ඒ සඳහා හැකිතරම් උපයෝගී කරගත යුත්තේ වනයේ දිරාගිය දැව පමණකි. එසේ ම අසල වනයට ගින්න පැතිරීම වළකා ගැනීමට ද ඔබ වගවලා ගත යුතු ය.

මේ සියලු උපදේශයන් සලකා බලමින් ඉතා නිවැරදි අන්දමින් කෑම්පින් කිරීම හෙවත් කඳවුරු බිමක රාත්‍රී කිහිපයක් ගත කිරීම ඕනෑම අයකුගේ ජීවිතයේ ලැබිය හැකි සුන්දර ම අත්දැකීමක් වනවා නොඅනුමානය.

■

## උඩුරාවණ ගෙ කතා

උඩුරාවණ නොම්මර එකේ මෝඩ උදාරම් කාරයෙක්. කාලයක් තිස්සෙ ඔහුගෙ කතා තැන තැන කියවෙනවා. අපි ඒ කතා රැසක් එක් රැස් කර ගත්තා. ඒ කතා ඉංගිරිසියෙන්ම පළ කරන්නෙ සිංහලට හැරෙව්වොත් ඒ රසය නැති වේ

Mr. Uduravana went to a grocery, collected the grocery and came to the counter and person at the counter started preparing bill for the items. Uduravana asked" Where is the fat ?"

The person didn't understand what Uduravana was saying and said "Excuse me sir, FAT???"
Uduravana : "Yes Fat, Give me the fat"

Uduravana started shouting and arguing with the person and all people gathered and Manager of that grocery stores came there and asked Uduravana about the problem.
Uduravana said
"Hey Manager look, I took a yogurt from your stores and it was written 'FAT FREE' on that but this guy is not giving me the fat".

### Udurawana on Tsunami

With a view to get as many differing views as possible on Tsunami, a journalist interviewed Udurawana. The subject was Tsunami

**Journalist** Mr Udurawana, I am from the 'Crazy World' and would like to know your views about the Dec 26 disaster

**Udu** Oh! The tee-sunami. Yes, yes, what do you want to know

**Journalist** Mr Udurawana, that word is pronounced as Sunami and the T in that word is silent

**Udu** I know, I know, not only T , all 52 letters in English are silent. How can letters shout

**Journalist** Fifty two? we have only 26 letters in the English alphabet

**Udu** You fool, count and see. Capital A, simple a, capital B, simple b… you see, fifty two

**Journalist** Mr Udurawana, what is the root cause of tsunami or abnormal sea waves. You know that tsunami is a Japanese word

**Udu** First, sunami is not a Japanese word. If Japanese why they write that in English. You say root cause. No no, roots do not cause sunami, sunami comes from sea bottom. There are no roots in sea bottom

**සන්නස දායකත්වය.... ඔබට පහසුවක්.. අපට සහයෝගයක්..**

දුර බැහැර වෙසෙන ඔබේ නිවසටම සන්නස තැපෑලෙන් ගෙන්වා ගන්න. සන්නස වාර්ෂික දායකත්වයක් ගන්න. එය ඔබට පහසුවකි. අපට සහයෝ ගයකි. පහත දැක්වෙන කූපනය පුරවා Sannasa News Group නමට ලියන ලද ඩොලර් 30 ක මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ සමග අප වෙත එවන්න.
**Sannasa** PO Box 172 Reservior VIC 3073

සන්නස SANNASA
අපේ උරුමය වෙනුවෙන්
දායකත්ව කූපනය

නම ..............................................

ලිපිනය (ඉංග්‍රීසියෙන් ලියන්න) ..............................................

..............................................

සන්නස තැපෑලෙන් ගෙන්වා ගැනීම සඳහා වසරක දායක මුදල ලෙස SANNASA NEWS GROUP නමට ලියන ලද ඩොලර් 30 ක මුදල් ඇනවුමක්/චෙක් පතක් මේ සමග එවමි

අත්සන                    දිනය